35 වන පිටෙන්




පාසල පිහිටියේ එහිය. පන්ති ආරම්භ වී ටික වේලාවක් යද්දී පරන්තන් හන්දිය පැත්තේ සිට දැඩි ලෙස වෙඩි ශබ්ද ඇසෙන්නට විය. ගුරුවරු වහාම පන්ති නතර කළහ. සියලු දෙනාම මහත් තැතිගැන්මට ලක්ව උන්හ. සමහර සිසුහු අඬන්නට පටන් ගත්තෝය. වෙඩි ශබ්දය මඳක් අඩුවූ පසුව ගුරුවරු වහාම නිවෙස් බලා දුවන ගමන් අපටද නිවෙස් කරා යන ලෙස  දැනුම් දුන්හ. මමද බියෙන් අඬමින් නිවෙසට පැමිණි විට එම වෙඩි තැබීම සිදුවී ඇත්තේ අපේ මිදුලේ බව මම දැනගත්තෙමි. අපේ මිදුලට රැස්ව උන් අසල්වැසියෝ කම්පනයෙන් ගල් ගැසී උන්හ.

අපේ නිවෙස පිහිටියේ " නවය මාර්ගයට ආසන්නයෙහිය. අපගේ නිවෙසේ තාප්පයේ කිසියම් සංවිධානයකට අයත් තරුණයෝ දෙදෙනෙක් පත්‍රිකා අලවමින් සිටියදී සිවිල් ඇඳුමෙන් මුර සංචාරයෙහි යෙදෙමින් සිටි හමුදාව ඔවුන් වෙත වෙඩි වර්ෂාවක් එල්ල කරන්නට පටන් ගත් විට එම තරුණයෝ තාප්පෙන් පැන අපේ නිවෙස දෙසට දුවගොස් ඇත. එක් තරුණයකුගේ හිසට වෙඩි පහර එල්ල වී ඇත්තේ අපේ මිදුලෙහිදීය. ඔහු එම ස්ථානයේදීම මිය ගොසින්ය. අනෙක් තරුණයා අපේ නිවෙස පිටුපස පිහිටි දුම්රිය මාර්ගය ඔස්සේ දුවගෙන ගොස් ඇත. මෙම සිද්ධීන් සිදුවූ මොහොතේ නිවසෙහි ආලින්දයේ මගේ ආච්චි හාල් පොලමින් සිටියාය.

අනපේක්ෂිත මෙම සිද්ධිය හේතුවෙන් දින කීපයක් යන තෙක් ආච්චි කිසිවක් කතා නොකර වික්ෂිප්ත තත්ත්වයට පත්ව උන්නාය. ආච්චිගේ බැල්ම අප තුළ ඇති කළේ භීතියකි. තම දෑස් ඉදිරිපිට එම ප්‍රාණය ගැහි ගැහී නිරුද්ධ වූ බවත්, එම සිරුර හමුදාව ඇදගෙන ගිය බවත් ආච්චි පසුව පැවසුවාය.

අපේ පාසලේ ඉහළ පන්තිවල ළමුන් උදෙසා නිතර නිතර සංවිධානවල නියෝජිතයෝ පැමිණ රැස්වීම් පැවැත්වීම සාමාන්‍ය දෙයක් විය. එහෙත් එම රැස්වීම්වලට මගේ පන්තියෙහි ළමුන් එක්කර ගත්තේ නැත. රැස්වීම් පැවැත්වෙද්දී අපි කෑ ගොස්සන් ගසන බව පවසා අප එළියට යවයි. එහෙත් එහි සිදුවන්නේ කුමක්ද යන්න දැන ගැනීමේ උනන්දුව නිසාම අපි නිවෙසට නොගොස් බාග බිත්තියෙහි එල්ලීගෙන එබී බලමින් සිටින්නෙමු. දවසින් දවස අලුත් අලුත් නම්වලින් යුතු සංවිධානවල අය්යලා පැමිණ රැස්වීම් පවත්වති.

කෝපයෙන් සහ ආවේගයෙන් කතා පවත්වති. අපේ පාසලේ ඉහළ පන්තිවල අය්යලා සහ අක්කලා ඔවුන්ගෙන් ප්‍රශ්න අසති. සමහර දවස්වල මහ හඬින් කෙරෙන විවාද පැවැත්වෙයි. ඒවා අපට අවබෝධ වූයේ නැතත්, ඔවුන් රැගෙන එන ආයුධ සහ ඔවුන්ගේ අධිෂ්ඨානය පිරි මුහුණු ද සිතෙහි ගැඹුරින් පැලපදියම් වෙයි.

එයට පසු කාලවකවානුවෙහි අපේ පාසලේ ඉහළ පන්තිවල ඉගෙන ගනිමින් සිටි බොහෝ සිසුන් අතුරුදහන් වන්නට විය. 'එයා අර සංවිධානයේ පුහුණුවට ගියා.' යනුවෙන් රහසින් පන්තිවල සිසුහු කතා වෙති. එලෙස ගිය අයගේ ගෙවල්වල ඥාතීහු එක්රැස්ව මළ ගෙයක් මෙන් විලාප තියා අඬන දර්ශන දැකගත හැකිවිය.

අපේ පාසලේ වූ උස වතුර ටැංකියේ සංවිධානවල පෝස්ටර් ඇලවීම සාමාන්‍ය දෙයක් විය. විවිධ සංවිධානවලට බැඳී සිටි සිසුන් අතර තරඟකාරී බවක් ඇතිවූ හෙයින් ඉතාමත් කුලුපග මිතුරු සම්බන්ධතා ඇති අය පවා ගැටුම් ඇති කරගෙන වෙන්වූහ. ඔවුන් අතර ගැටුම් හා දබරවීම් ඇතිවිය. සංවිධානවලට බැඳී සිටි අයගෙන් සමහරු පුහුණුව නිමකර ගමට පැමිණි අවස්ථාවේ ඔවුන්ගේ ස්වාභාවය මුළුමනින්ම පාහේ වෙනස් වී තිබුණි. වැදගත් අය පවා ඔවුන් කෙරෙහි ගෞරවයක් දක්වන තරමට ඔවුන්ගේ සමාජ ගෞරවය අධික වී තිබුණි. ''ඔයාලා හොඳට ඉගෙන ගෙන දියුණු වෙන්ඩ ඕනෑ නිසා තමයි අපි අරගලයට එකතුවෙලා ඉන්නේ. හොඳට ඉගෙන ගන්න. '' යැයි ඔවුහු කුඩා පන්තිවල ඉගෙන ගන්නා අපට උපදෙස් දෙති.

චිත්‍රපටවල එන වීරයන්ට වඩා ආයුධ සහිතව පාරේ ගමන් කරන එම තරුණයන් කෙරෙහි වන ආකර්ෂණය තරුණ තරුණියන් තුළ අධික විය. ඔවුන් දැකීමත් ඔවුන් ආශ්‍රය කිරීමත් අනෙක් අය තුළ එක්තරා අන්දමක ඇඟයීමක් ඇති කිරීමට සමත් විය. ඔවුහුද ගෙදර සාමාජිකයන් මෙන් ''අම්මේ-තාත්තේ, නංගි-මල්ලී'' යනුවෙන් ජනතාවට ආමන්ත්‍රණය කරමින් කතා බහ කළහ. එය 1986 වසර විය හැකියැයි මම සිතමි. කිලිනොච්චිය පොලිසිය හමුදා කඳවුරක් බවට පත් කර තිබුණි. යම් කිසි සංවිධානයක් විසින් දිනක් මැදියම් රැයෙහිදී එම කඳවුරට ප්‍රහාරයක් එල්ල කරන ලදි. එදින මධ්‍යම රාත්‍රියෙහි ඇති වූ ගිනිදැල් පරන්තන් දක්වා ප්‍රදේශය දහවල මෙන් ආලෝකවත් කරන්නට සමත් විය. කිලිනොච්චි නගරයට ආසන්නයෙහි වූ ගම් සියල්ලම නින්දෙන් අවදි වූහ.

හෙළිකොප්ටර්වලින් වටකරමින් ප්‍රහාර එල්ල කරමින් තිබිණි. ගොයම් කපා අවසන්ව තිබූ කුඹුරුවල පය හැපි හැපී අපි මැදියම් රැයේ පණ බේරා ගැනීමට පවුල් පිටින් පලා ගියෙමු. කිලිනොච්චි ප්‍රදේශයේ දිගටම ලංකාවේ හමුදාව බලවත්ව ස්ථානගත වීමට පටන් ගත්තේය. එහි සිට එළියට පැමිණෙන හමුදාවට සටන්කාමියෝ ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට පටන් ගත්හ. එම කාලයේදී " නවය මාර්ගයට ආසන්නයේ වාසය කළ අපේ පවුලට මහත් දුක් වේදනාවන්ට මුහුණ දීමට සිදුවිය. හමුදාව එන බවට ආරංචිය සවන් වැකුණු වහාම සියල්ල ඒ ඒ තැන්වල දමා දුවන්නට පටන් ගන්නෙමු. නැවත නිවෙස්වලට ඒමට හැකි වූයේ වෙඩි හඬ නතරවී සවස් වූ පසුවයි. ඒ වන තෙක් කුඩ දරුවන්ගේ කුස ගිනි නිවීම සඳහා වැඩිහිටියෝ මහත් වෙහෙසක් දැරූහ. මෙවැනි අවස්ථාවලදී අපි බොහෝ විට දුවන්නේ පොත් මල්ලත් රැගෙනය. මගේ සීයා නිවෙසෙහි ඇති ආහාර ද්‍රව්‍ය ඔසවාගෙන පැමිණෙයි. ඒ වන විට මම යමක් කමක් තේරෙන වයසේ පසුවූ හෙයින් දිගින් දිගටම මෙසේ සැනසීමක් නොමැතිව දිවීම එපා වී තිබුණි.

හමුදාව ප්‍රථම වතාවට කිලිනොච්චියේ සිට පරන්තන් දක්වා කාල තුවක්කු ප්‍රහාර ආරම්භ කළේය. දිනක් දහවල් මධ්‍යාහ්න වේලාවේ පුංචි සීයා හරකුන්ට වතුර දීම සඳහා කුඹුරු පැත්තට ගොස් සිටියේය. කාලතුවක්කු වෙඩි හඬවල් එකක් දෙකක් ඔහු ගිය පැත්තෙන් ඇසෙන්නට විය. ඒ පැත්ත දුමෙන් වැසී තිබුණි. ගෙදර අය හඬා වැලපීගෙන ඒ පැත්තට දුවගෙන ගියහ. එවිට පුංචි සීයා තුවායෙන් බඩ පැත්ත වසාගෙන අමාරුවෙන් අමාරුවෙන් එමින් සිටියේය. කාලතුවක්කු උණ්ඩයක කැබැල්ලක් ඔහුගේ උදරය සිදුරු කර ඇත. එහෙයින් බඩවැල් යම්තාක් දුරකට එළියට පැමිණ තිබුණි. මගේ මාමා සතුව කාර් රථයක් තිබුණත් එයින් රෝහලට යාමට නොහැකි විය. එයට හේතු වූයේ ගුවන් හමුදාවේ හෙළිකොප්ටරයක් පරන්තන් ප්‍රදේශයේ කැරකෙමින් ප්‍රහාර එල්ල කරමින් තිබීමයි. ඇත්තෙන්ම මම එදා දැඩි ලෙස කෝපයට පත්ව හැඬුවෙමි. මගේ සීයාව ආරක්ෂා කරගත නොහැකි වේ දෝ යැයි බියෙන් තැති ගත්තෙමි. එසේ වුවහොත් වහාම සංවිධානයකට බැඳෙන බවට තීරණය කළෙමි. ටික වේලාවකට පසුව හෙලිකොප්ටර් එම ප්‍රදේශයෙන් ඉවත්ව ගිය හෙයින් ඔහුව රෝහලට රැගෙන ගිය නිසා ජීවිතය බේරාගැනීමට හැකිවිය. මගේ පියා විපතකින් මියගිය පසුව අපිව ඇති දැඩි කළේ මාමා සහ අම්මාගේ දෙමව්පියන්ය. ඔවුන් කෙරෙහි අපි මහත් සෙනෙහසකින් උන්නෙමු.

හමුදාව සහ සන්නද්ධ සංවිධාන අතරේ පරන්තන් හන්දියෙහි නිතර නිතර ගැටුම් ඇතිවන්නට විය. ඒ අතර සන්නද්ධ සංවිධාන අතරෙත් ගැටුම් ඇතිවිය. රටට විමුක්තිය උදාකර ගැනීම සඳහා හමුදාව සමඟ සටන් කළ යුතු බව රැස්වීම්වලදී පැවසූ සංවිධානවල අය්යලා මේ අයුරින් තම තමන්ම ගැටුම් ඇති කරගන්නේ කුමක් නිසාද යන්න මා හට තේරුම් ගත නොහැකි විය. මම දිනපතාම පාසලට යා යුතු වූවේ පරන්තන් හන්දිය පසුකරය. එහිදී මා දුටු දර්ශනවලින් අපිට සැනසිලි සහගත අනාගතයක් හිමි වෙයි යන විශ්වාසය කිසිසේත් මා තුළ ඇති කළේ නැත. ඒ වෙනුවට ජීවිතය පිළිබඳව බියක් සහ අවිශ්වාස සහගත බවක් වර්ධනය වන්නට විය.

1987දී ඉන්දියානු හමුදාවේ පැමිණීම සිදුවන්නේ මෙවන් සන්දර්භයක් තුළය. ඒ වන විට මම දහවන පන්තියෙහි ඉගෙන ගනිමින් සිටියෙමි. දැන් සෑම ප්‍රශ්නයක්ම විසඳෙනැයි වැඩිහිටියෝ කතාබහ කළහ. අනෙක් අය වගේම අපිත් මාර්ගය අයිනට වී අත් සොලවා ඉන්දීය හමුදාව පිළිගත්තෙමු.

**මතු සම්බන්ධයි**

20 වන පිටෙන්

හැන්සල් ඇන්ඩ් ග්‍රෙටල්, ඇලඩින්ගේ පුදුම පහන, නිදි කුමාරි වැනි ප්‍රකට පුළුල් යුරෝපීය කතාන්දර දක්වා මෙම සුවිශේෂ සාහිත්‍යය පැතිරී තිබේ.

ළමා කතාන්දර ලෝකයේ නරි චරිතය සමග ප්‍රබල තේමාවක් මතු කෙරෙන කතාන්දරයක් ලෙස කපුටා සහ කේජු කෑල්ල දැක්විය හැකිය. කේජු බහුලව භාවිතාවන්නේ යුරෝපීය රටවල හෙයින් මෙය ජාත්‍යන්තරව පැතිරී ගිය නිර්මාණයක් ලෙස සැලකේ. නිවසකින් කේජු කැබැල්ලක් සොරා ගත කපුටකු පියාඹා විත් ගසක වසා එය කෑමට සැරසෙයි. මෙම සිදුවීම එක් නරියෙකුගේ විමසුමකට යොමු වේ. නරියාටද කේජු කෑමේ ගිජු කමක් පහළ වේ. කේජු කෑල්ල ලබා ගැනීමට උපායක් ගොතා ගනියි. කපුටාගේ හොටෙන් කේජු අතහරවා ගැනීමට නම් ඊට ගැලපෙන මිත්‍රත්වයක් ආරූඪ කර ගත යුතුය. නරියා කපුටාගේ දුක සැප විමසමින් උගේ හැඩනිල වර්ණනා කරන්නට පටන් ගනී. රන්වන් පියාපත්, ලස්සන දෙපා, ඇස් හා හොට මෙතරම් ලස්සන නම් කටහඬ කොතරම් මිහිරි වේදැයි කියාපායි. මේ චාටු බසින් උද්දාමයට වශිවූ කපුටාට කේජු අමතකවී කාක් කාක් හඬ නගන්නේ තම ආඩම්බරය ප්‍රවකාශ කිරීමටය. ඒත් ඒ සමගම ගිලිහුන කේජු කැබැල්ල නරියාගේ කටටම ලඟා වෙයි.

කපුටාගේ මංමුලාවූ බුද්ධියට පිළිසරණක් නොමැත. කතාන්දරය උච්චස්ථානයට පත්වන්නේ තම සටකපට කම ජය ගන්නා නරියා එම උද්දාමයෙන් කපුටු චරිතය සමච්චලයට ලක් කරමිනි. අනුන්ගේ රැවටිලිකාර වදන් වලින් රැවටෙන මෝඩ ජනයාට එල්ල කරන ලද නිර්දය සරදම සර්වකාලීන වටිනා කමකින් යුක්ත වුවක් බවට අපට පසක් වේ. නරියා මෙහිදී හැසිරෙන්නේ සමාජ යථාර්ථය සංකේතවත් කරන වැඩිහිටියකු සේය. කපුටා පිළිබඳව ඇතිවන්නේ ශෝකයකි. එහෙත් එය ආපසු දිනා ගත හැකි මෝඩකමක් නොවේ. අනුන්ගේ කපටිබසට රැවටී තම තමන්ගේ කේජු කැබලි (වටිනාකම්) අහිමි කර ගන්නා කොපමණ පිරිසක් සමාජයේ සිටිත්ද? කතාන්දරයක් යනු ශ්‍රව්‍ය  ගෝචර අපභ්‍රංශ සිදුවීමකට වඩා බුද්ධි ගෝචර දෘශ්‍ය  මෙවලමක්ද යන්න මෙයින් අවබෝධ කර ගත හැකිය.

(ලබන කලාපයට)

